සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

**වර්ෂ අවසාන ඇගයීම**
**ஆண்டிறுதி மதிப்பீடு - 2017**
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: පුරවැසි අධ්‍යාපනය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

**සැලකිය යුතුයි:**
(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

(01) රටක සියලු ම පුරවැසියන්ට පාලන කටයුතුවලට සහභාගීවීමට අවස්ථාව ලැබීම
(1) වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදයයි. (2) නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයයි.
(3) ඍජු ප්‍රජාතන්ත්‍රවාදයයි. (4) ව්‍යවස්ථානුගත ප්‍රජාතන්ත්‍රවාදයයි.

(02) "ප්‍රජාතන්ත්‍රවාදය යනු සියලු දෙනාටම අයිතිවාසිකම් හිමිවන පාලන ක්‍රමයයි." යනුවෙන් නිර්වචනය කළේ,
(1) ඒබ්‍රහම් ලින්කන් ය. (2) ජෝන් ලොක් ය.
(3) සීලර් ය. (4) ගානර් ය.

(03) නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන ඇතැම් රටවල් පාලන කටයුතුවලදී ඍජුවම ඡන්දදායකයන්ගේ අදහස් විමසුමට ලක් කරන අවස්ථාවකට උදාහරණයක් වන්නේ,
(1) ජනමත විචාරණයක් මගින් අදහස් විමසීම.
(2) ජනමාධ්‍ය මගින් අදහස් විමසීම.
(3) සාකච්ඡා මගින් තීරණවලට එළඹීම.
(4) කොමිෂන් සභා මගින් ජනතාවගේ සාක්ෂි කැඳවීම.

(04) ප්‍රාන්ත යන නම වෙනුවට "කැන්ටන්" ලෙස භාවිතා වන සන්ධීය රාජ්‍යය පහත රටවල් අතුරෙන් තෝරන්න.
(1) ඉන්දියාව (2) ඇමරිකා එක්සත් ජනපදය
(3) නවසීලන්තය (4) ස්විට්සර්ලන්තය

(05) ශ්‍රී ලංකාවේ සෑම පළාත් සභාවක් හා මධ්‍යම ආණ්ඩුව අතර සම්බන්ධීකරණය සිදුකරන නියෝජිතයා වශයෙන් කටයුතු කරන්නේ,
(1) ජනාධිපතිතුමා ය. (2) පළාත් ආණ්ඩුකාරතුමා ය.
(3) පළාතේ මහ ඇමතිතුමා ය. (4) අගමැතිතුමා ය.

(06) භෞතික ජීවන තත්ව දර්ශකය සකස් කිරීමට යොදාගන්නා සංරචකයකට අයත් නොවන්නේ,
(1) උපතේ දී ආයු කාලය (2) සාක්ෂරතාව
(3) ක්‍රයශක්තිය (4) ළදරු මරණ අනුපාතිකය

(07) ගැටුම් නිරාකරණය සඳහා යොදාගනු ලබන මූලිකම ක්‍රමය වන්නේ,

(1) බේරුම්කරණය. (2) සාකච්ඡා කිරීම.
(3) සමථකරණය. (4) විනිසීම.

(08) ජාතික මට්ටමින් නැතිනම් පුළුල් මට්ටමින් පවතින ගැටුම්කාරී තත්ත්ව හැඳින්වෙන්නේ,

(1) සූක්ෂම ගැටුම් යනුවෙනි. (2) අභ්‍යන්තර ගැටුම් යනුවෙනි.
(3) සාර්ව ගැටුම් යනුවෙනි. (4) අන්තර් ජාතික ගැටුම් යනුවෙනි.

(09) ගෝලීයකරණය නිසා ශ්‍රී ලංකාවට අත්වී ඇති සෘණාත්මක බලපෑමකි.

(1) බුද්ධිගලනය වේගවත් වීම.
(2) විදේශ ආයෝජන හා නවීන තාක්ෂණය ගලා ඒම.
(3) අකාර්යක්ෂම කර්මාන්ත වෙළඳපොළෙන් ඉවත්වීම.
(4) ආර්ථික විවිධාංගීකරණය වීම.

(10) ආර්ථිකය සතු සම්පත් අනාගත පරම්පරාව සඳහා සුරක්ෂිත කරමින් වර්තමාන අවශ්‍යතා ඉටුකර ගැනීම හැඳින්විය හැක්කේ,

(1) සමාජ සංවර්ධනය ලෙස ය. (2) සදාචාර සංවර්ධනය ලෙස ය.
(3) ආර්ථික සංවර්ධනය ලෙස ය. (4) තිරසාර සංවර්ධනය ලෙස ය.

(11) නිෂ්පාදන සාධක හා ඒවාට කරන ගෙවීම් පහතින් දක්වා ඇත. නොගැළපෙන පිළිතුර තෝරන්න.

(1) භූමිය - බදුකුලිය (2) ප්‍රාග්ධනය - ආයෝජනය
(3) ශ්‍රමය - වැටුප් (4) ව්‍යවසායකත්වය - ලාභය

(12) වෙළෙඳපොළ ආර්ථිකයක දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණය වන්නේ,

(1) මහජන සුබසිද්ධිය අරමුණු කරගෙන නිෂ්පාදනය සිදුවීම.
(2) නිෂ්පාදන සාධකවල අයිතිය රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශය ම සතුවීම.
(3) වෙළෙඳපොළ බාධා, ආනයන අපනයන බදු ඉවත් කිරීම.
(4) පොදු යහපත සඳහා සුබසාධන කටයුතු කිරීමට රජය මැදිහත් වීම.

(13) කිසියම් ආර්ථිකයක සිදුවන ක්‍රියාවලීන් පිළිවෙලින් දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1) නිෂ්පාදනය / බෙදාහැරීම / පරිභෝජනය
(2) නිෂ්පාදනය / වෙළෙඳාම / බෙදාහැරීම
(3) නිෂ්පාදනය / තොග වෙළෙඳාම / සිල්ලර වෙළෙඳාම
(4) පරිභෝජනය / බෙදාහැරීම / වෙළෙඳාම

(14) නිදහස් වෙළෙඳාම සම්බන්ධ උතුරු ඇමරිකානු නිදහස් වෙළෙඳ ගිවිසුම හෙවත් NAFTA සංවිධානයේ සාමාජික රටකට උදාහරණයකි.

(1) ප්‍රංශය (2) ඉන්දියාව
(3) පින්ලන්තය (4) කැනඩාව

(15) ශ්‍රී ලංකාවේ නව සංවර්ධන ප්‍රවණතා විමසා බැලීමේ දී 1994 - 2004 යුගයන්හි දක්නට ලැබූ විශේෂ ලක්ෂණයක් වන්නේ,

(1) යටිතල පහසුකම් සැපයීම සඳහා පෞද්ගලික අංශයේ දායකත්වය ලබාගැනීම.

(2) වැවිලි කර්මාන්තයට මූලිකත්වය ලබාදීම.

(3) සලාක ක්‍රම ක්‍රියාත්මක කිරීම.

(4) සංවර්ධනය වැඩි වශයෙන් දේශීය සම්පත් මත රඳා පැවතීම.

(16) තිරසර සංවර්ධනයේ මූලික අරමුණ වන්නේ,

(1) ජනතාවගේ මූලික අවශ්‍යතා ඉටුකර ගැනීම.

(2) ස්වභාවික සම්පත් කළමනාකරණය කර ගනිමින් මිනිස් අවශ්‍යතා ඉටුකර ගැනීම.

(3) නවීන තාක්ෂණයත් සමඟ සෙසු රටවල් අභිබවා ඉදිරියට ගමන් කිරීම.

(4) සමාජයේ පවතින විවිධ සංස්කෘතික අංග පරිසරය සමඟ සමෝධානය කර ගැනීම.

(17) සන්ධීය ආණ්ඩුක්‍රමයක ඇති යහපත් ලක්ෂණයක් පහත පිළිතුරු අතුරෙන් තෝරන්න.

(1) විවිධත්වයක් පවතින ජන සමාජයක් තුළ විවිධත්වයට ගරු කිරීම මගින් පොදු ජාතිකත්වයක් ගොඩනගා ගැනීම.

(2) මධ්‍යම ආණ්ඩුව වෙතින් ප්‍රාන්ත වෙන්ව යාමට උත්සාහ ගැනීම පිළිබඳව ඇති වී තිබෙන ප්‍රවණතාව.

(3) බලය බෙදා දීම තුළ ප්‍රාන්ත ආණ්ඩුවලට ලැබී තිබෙන බලතල වලින් ඔවුන් තෘප්තිමත් නොවීම.

(4) ප්‍රාන්ත පරිපාලනය සඳහා අත්දැකීම් සහිත පළපුරුදු නිලධාරීන් නොසිටීම.

(18) රාජ්‍ය බලය ක්‍රියාවට නැංවීමේ උත්තරීතර නීතිය යනු,

(1) දේශීය නීතියයි. (2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතියයි.

(3) අපරාධ නීතියයි. (4) සිවිල් නීතියයි.

(19) ශ්‍රේෂ්ඨාධිකරණයට අමතරව ශ්‍රී ලංකාවේ පවතින ජ්‍යෙෂ්ඨතම අධිකරණ ආයතනය වන්නේ,

(1) මහාධිකරණය (2) මහේස්ත්‍රාත් අධිකරණය

(3) අභියාචනාධිකරණය (4) පළාත් බද මහාධිකරණය

(20) සංවර්ධනය පිළිබඳ ව එක්සත් ජාතීන්ගේ සංවිධානය 2000 දී පැවැත්වූ සහස්‍රක සමුළුවේ දී සහස්‍රක ඉලක්ක අටට ඇතුළත් නොවූ වගන්තිය තෝරන්න.

(1) දුප්පත්කම හා සාගින්න තුරන් කිරීම. (2) රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලීකරණය කිරීම.

(3) ළදරු මරණ අනුපාතය අඩුකිරීම. (4) පාරිසරික තිරසර බව සුරක්ෂිත කිරීම.

(21) එක්සත් ජාතීන් විසින් මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය සම්මත කරන ලද්දේ,

(1) 1948 දෙසැම්බර් 10 වන දින ය. (2) 1948 නොවැම්බර් 10 වන දින ය.

(3) 1948 මාර්තු 10වන දින ය. (4) 1948 පෙබරවාරි 10 දින ය.

(22) A - ජාතික රාජ්‍ය සභාව ආරම්භ වීම.

B - අග්‍රාණ්ඩුකාර ධූරය අහෝසි කර ජනාධිපති ධූරය ඇති කිරිම.

C - පාර්ලිමේන්තු කොමසාරිස් ධූරයක් ඇති කිරීම.

D - විධායක බලය සහිත ජනාධිපති ධූරයක් ඇති කිරීම.

ඉහත A, B, C, D හි සඳහන් ලක්ෂණ අතුරෙන් 1978 ශ්‍රී ලංකා දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අයත් ලක්ෂණ පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) A හා B (2) C හා D (3) B හා C (4) A හා D

(23) 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ හඳුන්වා දුන් සංවෘත ලැයිස්තුවට අයත් විෂය යුගලයක් සඳහන් වරණය තෝරන්න.

(1) ආගමනය, විගමනය හා පුරවැසිභාවය (2) ජාතික නිවාස සහ ඉදිකිරීම
(3) සමාජ සේවා හා පුනරුත්ථාපනය (4) කෘෂිකර්ම හා ගොවිජන සේවා

(24) පාරිසරික ගැටලු ඇතිවීම සඳහා මුල්වන ප්‍රධානතම හේතුව වන්නේ,

(1) ස්වභාවික විපත් ය. (2) ජනගහණ වර්ධනය ය.
(3) සම්පත් අධිපරිභෝජනය ය. (4) කෘෂිකාර්මික කටයුතු නවීකරණය ය.

(25) සංවර්ධනය මැනීම සඳහා යොදාගනු ලබන මානව සංවර්ධන දර්ශකය ගණනය කිරීමට පහත කුමන දර්ශක යොදාගනු ලැබේ ද?

(1) සාක්ෂරතාව / උපතේ දී ආයු අපේක්ෂාව / ළදරු මරණ අනුපාතිකය
(2) උපතේ දී ආයු අපේක්ෂාව/අධ්‍යාපනය/ක්‍රය ශක්තිය මත ගැළපූ ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදනය
(3) ඒක පුද්ගල ආදායම / සාක්ෂරතාව / ළදරු මරණ අනුපාතිකය
(4) මාතෘ මරණ අනුපාතිකය / ළදරු මරණ අනුපාතිකය / සාක්ෂරතාව

(26) පහත "අ" තීරුව හා "ආ" තීරුව නිවැරදිව ගැළපූ විට නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන වරණය තෝරන්න.

| "අ" | "ආ" |
|---|---|
| 1. දේශපාලන අයිතිවාසිකමකි. | (a) අධ්‍යාපනය ලැබීමේ අයිතිය |
| 2. ආර්ථික අයිතිවාසිකමකි. | (b) තමන් කැමැති ආගමක් ඇදහීමේ අයිතිය |
| 3. සිවිල් අයිතිවාසිකමකි. | (c) මහජන නියෝජිතයකු තෝරාපත් කරගැනීමේ අයිතිය |
| 4. සංස්කෘතික අයිතිවාසිකමකි. | (d) රැකියාවකින් සාධාරණ වැටුපක් ලබා ගැනීමේ අයිතිය |

(1) a , d , c , b (2) b , a , d, c (3) c , d, a, b (4) a , b , c , d

(27) සංවර්ධනය වෙමින් පවතින රටකට උදාහරණයකි.

(1) ඉන්දියාව (2) ජපානය (3) දකුණු කොරියාව (4) ප්‍රංශය

(28) සම්පත්වල ඵලදායීතාව හා කාර්යක්ෂමතාව වැඩි කිරීම මගින් තිරසර සංවර්ධනය ළඟා කර ගැනීම සඳහා යොදාගත හැකි ප්‍රධාන ක්‍රමවේදයකි.

(1) 3R සංකල්පය (2) 4Rසංකල්පය (3) 5R සංකල්පය (4) 6R සංකල්පය

(29) මානව හිමිකම් කඩවීමක් සම්බන්ධව ශ්‍රී ලාංකිකයකුට පැමිණිලි කළ හැකි ඉහළ ම ජාත්‍යන්තර ආයතනය මින් කවරක් ද?

(1) ජාත්‍යන්තර අධිකරණය (2) එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය
(3) එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය (4) එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම

(30) ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සකස් කිරීමට පදනම් කරගෙන ඇති මූලධර්ම ගණන නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) 2කි. (2) 4කි. (3) 3කි. (4) 5කි.

(31) කිසියම් රටක් රාජ්‍ය උපාය සම්බන්ධතා ගොඩනගා ගැනීමේ දී බලපාන වැදගත්ම සාධකය වන්නේ එම රටෙහි

(1) ආර්ථික ප්‍රතිපත්තියයි. (2) දේශපාලන ප්‍රතිපත්තියයි.
(3) සමාජ සත්කාරක ප්‍රතිපත්තියයි. (4) විදේශ ප්‍රතිපත්තියයි.

(32) ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධනය හා තහවුරු කිරීමේ අරමුණ ඇතිව පිහිටුවා ඇති එක්සත් ජාතීන්ගේ අනුබද්ධ ආයතනයක් වන්නේ,

(1) යුනෙස්කෝව ය. (2) යුනිසෙප් ය.
(3) ලෝක ආහාර හා සෞඛ්‍ය සංවිධානය ය (4) ලෝක බැංකුව ය.

(33) මිනිසාගේ පැවැත්ම සඳහා අවශ්‍ය ආර්ථික උපකාරක සේවා පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) ඛනිජ, භූමිය, වාතය (2) ඛනිජ, භූමිය, ජලවිදුලිය
(3) හිරු එළිය, වාතය, ජලය (4) හිරු එළිය, ජීවවායු, භූතාපය

(34) ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ පුරවැසියකු ලෙස සැලකෙන කඩඉම් වයස ලෙස දක්වන්නේ,

(1) අවුරුදු 60 - 75 (2) අවුරුදු 65 - 75
(3) අවුරුදු 50 - 75 (4) අවුරුදු 55 - 60

(35) පරිසරය සම්බන්ධ පුරවැසියන්ගේ ප්‍රධාන යුතුකමක් වන්නේ,

(1) පරිසරය සම්බන්ධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
(2) පාරිසරික සම්පත් අරපිරිමැස්මෙන් භාවිතා කිරීම.
(3) පරිසරය සම්බන්ධ නීති රාමුවට අනුකූලව කටයුතු කිරීම.
(4) සංවර්ධන කටයුතුවල දී පරිසර පිරිවැය තක්සේරු කිරීම.

(36) වායු දූෂණයේ ස්වභාවික ක්‍රමයක් නොවන පිළිතුර තෝරන්න.

(1) පොසිල ඉන්ධන භාවිතා කිරීම. (2) ගිනි කඳු පිපිරීම.
(3) ලැව්ගිනි ඇතිවීම. (4) දූවිලි කුණාටු ඇතිවීම.

(37) ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් වැඩි ප්‍රමාණයක් ජීවත්වන පළාත් පාලන ආයතනය වන්නේ,

(1) නගරසභා (2) මහ නගරසභා (3) ප්‍රාදේශීය සභා (4) ගම් සභා

(38) නීතිපතිතුමාගේ ප්‍රධාන කාර්යයක් වශයෙන් දක්වා ඇත්තේ,

(1) රජය සම්බන්ධ නඩුවල දී අවශ්‍ය නීති උපදෙස් ලබාදීම.
(2) ඇපදීම හා නඩු කටයුතු නැවැත්වීම.
(3) අභියාචනා භාරගැනීම, විභාග කිරීම.
(4) අධිකරණය සම්බන්ධ රීති සංශෝධනය කිරීම.

(39) එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ නිත්‍ය සාමාජිකයින් පස්දෙනා ඇතුළත් නිවැරදි පිළිතුර තෝරන්න.

(1) චීනය, බ්‍රිතාන්‍ය, ජර්මනිය, ප්‍රංශය, කියුබාව
(2) චීනය, බ්‍රිතාන්‍ය, ප්‍රංශය, ඇමරිකා එක්සත් ජනපදය, රුසියාව
(3) ප්‍රංශය, ඉන්දියාව, කැනඩාව, ජපානය, රුසියාව
(4) ප්‍රංශය, ඇමරිකා එක්සත් ජනපදය, කොරියාව, ඉන්දියාව, ජර්මනිය

(40) විදේශ වෙළෙඳාම හා සම්බන්ධ ජාත්‍යන්තර සංවිධානයක් වන්නේ,

(1) උන්ක්ටාඩ් සංවිධානය. (2) එක්සත් ජාතීන්ගේ සංවිධානය.
(3) නේටෝ සංවිධානය. (4) සාර්ක් සංවිධානය.

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: පුරවැසි අධ්‍යාපනය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 02 |

සැලකිය යුතුයි:
- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

---

(01) (i) නූතන රාජ්‍ය තුළින් හඳුනාගත හැකි දේශපාලන පක්ෂ ක්‍රමයේ ස්වරූප දෙකක් නම් කරන්න.

(ii) ආණ්ඩුවේ ප්‍රධාන ආයතන දෙකක් ලියන්න.

(iii) ඒකීය ආණ්ඩුක්‍රම පවතින රාජ්‍යයන් දෙකකට උදාහරණ දෙන්න.

(iv) එක්සත් ජාතීන්ගේ ප්‍රධාන ආයතන දෙකක් සඳහන් කරන්න.

(v) පරිවර්තන ආර්ථිකයන්හි මූලික ලක්ෂණ දෙකක් නම් කරන්න.

(vi) නීතිය ක්‍රියාත්මක වන ආකාරය අනුව බෙදිය හැකි කොටස් දෙක ලියන්න.

(vii) සංවර්ධනය මනින සම්ප්‍රදායික ක්‍රම දෙකක් සඳහන් කරන්න.

(viii) අන්තර් ජාතික වෙළෙඳාමේ ප්‍රධාන ආකාර දෙක නම් කරන්න.

(ix) ව්‍යවස්ථාදායකයේ (පාර්ලිමේන්තුව) කාර්යයන් දෙකක් ලියන්න.

(x) ශ්‍රී ලංකාවේ අධිකරණ කටයුතු හා නීතිය පිළිබඳව ඉහළම තලයේ සිටින ප්‍රධාන භූමිකා දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02 x 10 = 20)

(02) ලෝකයේ බොහෝ රටවල් ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය තම රටවල පාලනය සඳහා යොදාගෙන ඇත.

(i) පාලන ක්‍රමයක් ලෙස ඍජු ප්‍රජාතන්ත්‍රවාදය වර්තමානයේ ක්‍රියාත්මක කිරීමේ දී මතුවන ගැටලු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් පවතින රටක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව කටයුතු කිරීම නිසා ලැබෙන ප්‍රයෝජන තුනක් නම් කරන්න. (ලකුණු 03)

(iii) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක සාර්ථකත්වයට බලපාන සාධක තුනක් නම්කර, ඉන් එකක් එහි සාර්ථකත්වයට බලපාන ආකාරය විස්තර කරන්න. (ලකුණු 05)

(03) බලයේ අවසාන හිමිකරුවා වන්නේ මහජනතාව වන අතර මහජනතාව සතු එම බලය පරමාධිපත්‍යය බලය ලෙස හඳුන්වයි.

(i) නූතන රාජ්‍යවල බලය බෙදාහැරීමට හේතු දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) පළාත් ආණ්ඩුකාරවරයා සතු බලතල හා කාර්යයන් තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) ශ්‍රී ලංකාවේ පළාත් සභාවල සහ පළාත් පාලන ආයතනවල ප්‍රයෝජන තුනක් ලියා ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

(04) ගැටුම් සෑම සමාජයක් තුළම නොවැළැක්විය හැකි සංසිද්ධියකි.

(i) ගැටුම් ඇතිවීමට බලපාන සාධක දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) ගැටුම් නිරාකරණය කර ගැනීම සඳහා පුරවැසියෙකු සතු පුද්ගල ගුණාංග තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) ගැටුම් සාමකාමීව නිරාකරණය කිරීමේ වාසි දෙකක් ලියා ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(05) නීතියට ගරු කිරීම හා අවනත වීම පුරවැසියන්ගේ වගකීම වේ.

(i) නීතියේ මූලාශ්‍ර දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන අධිකරණ වර්ග තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) ශ්‍රී ලංකාවේ අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කර ඇති ප්‍රතිපාදන තුනක් නම් කර, ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

(06) මිනිසත්බව ලැබීම නිසා කිසිදු භේදයකින් තොරව මිනිසාට උපතින් ම හිමිවන අයිතිවාසිකම් මානව අයිතිවාසිකම් ලෙස හැඳින්විය හැකි ය.

(i) සිවිල් හා දේශපාලන අයිතාවාසිකම් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ පනතට අදාළ නීතිමය ලේඛන තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) අයිතිවාසිකම් හා බැදුණු පුරවැසි යුතුකම් වර්ග කළ හැකි ආකාර දෙක නම් කර, පුරවැසියකු ලෙස ඉන් එක් යුතුකම් වර්ගයක් ඉටුකරන ආකාරය විස්තර කරන්න. (ලකුණු 05)

(07) පරිසරය යනු ජීවී අජීවී සංරචකවල සංකලනයකි.

(i) පරිසර පද්ධතිය සකස් වී ඇති ප්‍රධාන සංරචක දෙක සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) පරිසරය හා සම්බන්ධ පුරවැසි වගකීම් හා යුතුකම් තුනක් නම් කරන්න. (ලකුණු 03)

(iii) සංවර්ධනය වෙමින් පවතින රටවලට බලපාන ගැටලු තුනක් සඳහන් කර, ඉන් එක් ගැටලුවක් විස්තර කරන්න. (ලකුණු 05)